# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 32 වැනි කාණ්ඩය | පෙබරවාරි 2023



## නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් පෙබරවාරි 08 වැනිදා විවෘත කෙරිණි

සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කිරීමෙන් අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 ව්‍යවස්ථාව ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පෙ.ව 10.00 ට පමණ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම සිදුවිය.

සන්නිවේදන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව




## පුවත්

- ඒ. එච්.එම් ෆව්සි මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දෙයි.
- ශ්‍රී ලංකාවේ ටියුනීසියානු තානාපතිනිය පාර්ලිමේන්තුවේ කථානායකවරයා හමුවෙයි.
- ශ්‍රී ලංකාවේ බෙලරූස් තානාපතිවරයා කථානායකවරයා හමුවෙයි.
- පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම්වරිය පාර්ලිමේන්තුවේ සභානායකවරයා හමුවෙයි.
- පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේ ජය ‘වන් ටු වන්’ කණ්ඩායමට.
- දකුණු කොරියානු තානාපතිවරයා සහ කථානායකවරයා අතර හමුවක්.
- රුසියානු දූත පිරිසක් නියෝජ්‍ය කථානායකවරයා හමුවෙයි.
- ශ්‍රී ලංකා - ඇමෙරිකානු එක්සත් ජනපද පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපති ධුරයට ගරු චන්දිම වීරක්කොඩි මහතා පත්වෙයි.

## කාරක සභා පුවත්

- පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නව සභාපතිවරයා ලෙස ගරු ලසන්ත අලගියවන්න මහතා වැඩි ඡන්දයෙන් තේරී පත්වෙයි.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප් කමිටුවේ) නව සභාපතිවරයා ලෙස (මහාචාර්ය) ගරු රන්ජිත් බණ්ඩාර මහතා වැඩි ඡන්දයෙන් තේරී පත්වෙයි.
- පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ආර්ථික ස්ථායීකරණ අනු කාරක සභාවේ දෙවැනි වාර්තාව පිළිබඳ තරුණ නියෝජිතයින් ඇතුළු පාර්ශ්ව කිහිපයක් දැනුවත් කෙරේ.
- ග්‍රාමීය ණය සහ සමාජ ආරක්ෂණ දැල සම්බන්ධයෙන් ජාතික සභා අනු කාරක සභාවේ අවධානය.
- දැරිය හැකි මිලකට විශ්වාසදායක දිවාසුරැකුම් ක්‍රමවේදයන් ළමයින් වෙනුවෙන් නොමැතිවීම නිසා කාන්තාවන් බහුතරයකට රැකියා කිරීමට නොහැකි තත්ත්වයක් උදාවෙලා - වෙරිටේ රිසර්ච් ආයතනය පාර්ලිමේන්තු තාරක සභාවට පවසයි.
- ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාවක් පිහිටුවීමට පියවර.

## ජායා ගැලරිය



# කවරයේ කතාව

## නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරේ

■ **ආචාර වෙඩි මුර සහ රථ පෙළපාලිවලින් තොර චාම් උත්සවයක්**

නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සවාකාරයෙන් මේ මස08 වැනිදා විවෘත කෙරිණි.

සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කිරීමෙන් අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 ව්‍යවස්ථාව ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පෙ.ව 10.00 ට පමණ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම සිදුවිය.

නව සභාවාරය විවෘත කිරීමේ අවස්ථාව චාම් උත්සවයක් ලෙස පැවැත්වීමට ජනාධිපතිවරයාගේ උපදෙස් මත කටයුතු යොදා තිබිණි.

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා සහ එම මැතිණියගේ පැමිණීමෙන් පසු, අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ පැමිණීම සිදු වූ අතර, ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ එම ආර්යාවගේ සම්ප්‍රාප්තිය සිදු වූයේ ඉන් අනතුරුවයි.

එහිදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ප්‍රධාන පියගැට පෙළ අසලදී ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා පිළිගනු ලැබූහ.

ඉන් අනතුරුව වේත්‍රධාරී, නියෝජ්‍ය වේත්‍රධාරී සහ සහකාර වේත්‍රධාරී පෙරටු කරගත් ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා විසින් ජනාධිපතිතුමා පාර්ලිමේන්තු මන්දිරය වෙත කැදවා ගෙන යනු ලැබිණි.

එම අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසල දී නාවල ජනාධිපති බාලිකා විද්‍යාලයේ සිසුවියන් විසින් ජයමංගල ගාථා ගායනා කර, ජනාධිපතිතුමාට සහ පාර්ලිමේන්තුවට ආශිර්වාද එක් කිරීම සිදුවිය.

අනතුරුව පැළඳුම් කාමරයට පැමිණෙන ජනාධිපතිවරයා පෙ.ව 9.55 පමණ වන තෙක් එහි රැදී සිට සම්ප්‍රදායට අනුව නියෝජ්‍ය වේත්‍රධාරී, සෙංකෝලය අතැති වේත්‍රධාරී, ජනාධිපතිවරයා, කථානායකවරයා, මහලේකම්වරු සහ සහකාර වේත්‍රධාරී යන අනුපිළිවෙලට පෙරහරින් සභාගර්භයට ඇතුළු වීම සිදු විය.

සභාගර්භයට පිවිසෙන ජනාධිපතිවරයා සභාවේ මුලසුන දරමින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළේය. අනතුරුව මේ මස 09 වැනිදා පෙ.ව 9.30 දක්වා සභාව කල් තැබීම සිදුවිය.

ඉන් පසු රාජ්‍ය තාන්ත්‍රිකයන් ඇතුළු ආරාධිත අමුත්තන් වෙනුවෙන් තේ පැන් සංග්‍රහයක්ද සංවිධානය කර තිබිණි.

# පුවත්

## ඒ. එච්.එම් ෆව්සි මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස දිවුරුම් දෙයි.

ඒ. එච්.එම් ෆව්සි මහතා 09 වැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් ලෙස කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ඉදිරියේ මේ මස 09 වැනිදා දිවුරුම් දුන්නේය.

කථානායකවරයා ඉදිරියේ දිවුරුම්දීමෙන් පසු ඒ මහතා පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා ඉදිරියේදී මන්ත්‍රී නාමලේඛනයේ අත්සන් තැබීය.

සමගි ජනබලවේගය නියෝජනය කරමින් කොළඹ මැතිවරණ කොට්ඨාශයේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ මුජිබර් රහ්මාන් මහතා සිය ධූරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුවට ෆවුසි මහතා මෙලෙස පත් කර තිබේ.

1937.10.13 වන දින උපත ලබා ඇති ෆවුසි මහතා 1959 වසරේදී ක්‍රියාකාරී දේශපාලනයට පිවිස ඇත. 1968 වසරේදී කොළඹ නියෝජ්‍ය පුරපති ලෙස තේරී පත්වුණු ඒ මහතා 1973 වසරේදී 16 වැනි කොළඹ පුරපති ලෙස තේරී පත්විය. 1993 වසරේදී බස්නාහිර පළාත් සභාවට තේරී පත්වූ ෆවුසි මහතා 1994 මහමැතිවරණයට තරග කොට පාර්ලිමේන්තුවට තේරී පත්විය. ඒ මහතා විසින් විවිධ අමාත්‍යධූර රැසක් ද හොඹවා ඇත.








## පුවත්

# ශ්‍රී ලංකාවේ ටියුනීසියානු තානාපතිනිය පාර්ලිමේන්තුවේ කථානායකවරයා හමුවෙයි



ශ්‍රී ලංකාවේ ටියුනීසියානු තානාපතිනිය වන හේයත් ටැල්බි මහත්මිය පාර්ලිමේන්තුවේ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමු විය. මේ මස 03 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවති මෙම හමුවට පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතාද එක්ව සිටියේය.

දෙරට අතර රාජතාන්ත්‍රික සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම පිළිබඳ මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි. එමෙන්ම දෙරට අතර සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම, ව්‍යාපාරික සබඳතා ශක්තිමත් කිරීම මෙන්ම දෙරටේ පාර්ලිමේන්තු අතර අන්තර් පාර්ලිමේන්තු සබඳතා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවද මෙහිදී කරුණු සාකච්ඡා විය.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ටියුනීසියාවේ උපරිම සහයෝගය ලබා දෙන බවද තානාපතිනිය මෙහිදී සඳහන් කළාය.





# පුවත්

## ශ්‍රී ලංකාවේ බෙලරූස් තානාපතිවරයා කථානායකවරයා හමුවෙයි.



ශ්‍රී ලංකාවේ බෙලරූස් රාජ්‍යයේ තානාපති අන්ද්‍රයි රෙස්කි මහතා සහ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා අතර හමුවක් මේ මස 02 වැනිදා පැවැත්විණි.

දෙරට අතර මීට පෙර පැවති  පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය නැවත ස්ථාපිත කිරීමත් ඒ හරහා ද්විපාර්ශවීය සබඳතා පවත්වා ගැනීමේ අවශ්‍යතාවත් මෙහිදී සාකච්ඡා විය.

එසේම ශ්‍රී ලංකාවේ සහ බෙලරූස් රාජ්‍යයේ විශ්ව විද්‍යාල අතර අන්තර් සම්බන්ධය වැඩි දියුණු කිරීමෙන් දෙරට සිසුන්ට අධ්‍යාපන අවස්ථා  වැඩි වශයෙන් ලබා දීම කෙරෙහිද මෙහිදී අවධානය යොමුවිය.

පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.






# පුවත්

## පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම්වරිය පාර්ලිමේන්තුවේ සභානායකවරයා හමුවෙයි.



පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් පැට්‍රීශියා ස්කොට්ලන්ඩ් මහත්මිය ප්‍රමුඛ නියෝජිත පිරිස පාර්ලිමේන්තුවේ සභානායක සහ අධ්‍යාපන අමාත්‍ය (ආචාර්ය) ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා මේ මස 02 වැනිදා පාර්ලිමේන්තුවේ දී හමු විය.

එහිදී, මෙරට අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය කිරීම, කෘත්‍රිම බුද්ධිය භාවිතය වැඩිදියුණු කිරීම, ඩිජිටල්කරණය ප්‍රචලිත කිරීම සහ අදාළ ක්ෂේත්‍රවල පවතින අවස්ථාවන් හඳුනාගැනීම පිළිබඳව දෙපාර්ශවය අතර පුළුල් සාකච්ඡාවක් පැවැත්විණි.

මෙම නියෝජිත පිරිස පාර්ලිමේන්තුවේ මහ ලේකම් දම්මික දසනායක මහතා විසින් පිළිගන්නා ලදී.

මෙම අවස්ථාවට පොදුරාජ්‍ය මණ්ඩලයේ සහකාර මහලේකම් මහාචාර්ය ලුයිස් ෆ්‍රැන්සිස්වි, පොදුරාජ්‍ය මණ්ඩලීය මහලේකම් කාර්යාලයයේ මාණ්ඩලික ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ඩෙබොරා ජේම්සන්, පොදුරාජ්‍ය මණ්ඩලීය පාලන හා සාම අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශක සහ ප්‍රධානී (ආසියානු කලාපීය) දිනීෂා පණ්ඩිතරත්න, මාධ්‍ය සහ මහජන කටයුතු පිළිබඳ සන්නිවේදන නිලධාරී ඇමී කෝල්ස්, යන මහත්ම මහත්මීහු මෙම අවස්ථාවට එක්ව සිටියහ.






# පුවත්

## පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේ ජය 'වන් ටු වන්' කණ්ඩායමට



පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය 2023 - අන්තර් දෙපාර්තමේන්තු සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියේ ජය රමේෂ් මලින්ද නායකත්වය ලබා දුන් 'වන් ටු වන්' කණ්ඩායම විසින් දිනා ගන්නා ලදී. එසේම අනුශූරතාව ප්‍රදීප් රණතුංගගේ නායකත්වයෙන් යුත් 'දියවන්නා රයිඩර්ස්' කණ්ඩායමට හිමිවිය.

පාර්ලිමේන්තු ක්‍රීඩා සමාජය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන මෙම ක්‍රිකට් තරගාවලිය මෙවර බත්තරමුල්ල ජී.එච්. බුද්ධදාස ක්‍රීඩාංගනයේදී පැවැත්විණි.

එසේම කාන්තා ක්‍රිකට් කණ්ඩායම් අතර පැවති තරගාවලියේ ශූරතාව ගීතානි විදානපතිරණගේ නායකත්වයෙන් යුත් "ගෝල්ඩන් ෆ්ලේම්ස්" කණ්ඩායම දිනාගත් අතර අනුශූරතාව නිලක්ෂි ධර්මදාසගේ නායකත්වයෙන් යුත් "පාර්ලිමන්ට් ඒන්ජල්ස්" කණ්ඩායමට හිමිවිය.

මේ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ක්‍රිකට් කණ්ඩායම සහ තරගාවලියේ සංවිධායක මණ්ඩලය අතර ප්‍රදර්ශනාත්මක තරගයක්ද මෙහිදී පැවති අතර එහි ජය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කණ්ඩායමට හිමිවිය.

පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කතානායක ගරු අජිත් රාජපක්ෂ මහතා ඇතුළු ගරු මන්ත්‍රීවරයන් පිරිසක්ද, පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර යන මහත්ම මහත්මීහු ද පාර්ලිමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.








# පුවත්

## දකුණු කොරියානු තානාපතිවරයා සහ කථානායකවරයා අතර හමුවක්.




ශ්‍රී ලංකාවේ දකුණු කොරියානු තානාපති වුන්ජින් ජියෝන් මහතා ඇතුළු දකුණු කොරියාවේ බුසාන් මෙට්‍රොපොලිටන් නගර සභාවේ සාමාජිකයන් දහතුන් දෙනෙකුගෙන් යුතු දූත පිරිසක් මේ මස 17 වැනිදා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවිය.

දෙරට අතර සම්බන්ධතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් මෙන්ම 2030 වසරේදී දකුණු කොරියාවේ පැවැත්වීමට නියමිත බුසාන් ලෝක ප්‍රදර්ශනය සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා පැවැත්විණි.


මෙම අවස්ථාවට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා - දකුණු කොරියානු මිත්‍රත්ව සංගමය නියෝජනය කරමින් රාජ්‍ය අමාත්‍ය ගරු කාදර් මස්තාන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු යදාමිණි ගුණවර්ධන සහ ගරු කරුණාදාස කොඩිතුවක්කු යන මහත්වරු ද, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ද සහභාගි වූහ.





# පුවත්

## රුසියානු දූත පිරිසක් නියෝජ්‍ය කථානායකවරයා හමුවෙයි.



රුසියාවේ ව්ලැඩිමියර් ප්‍රාන්ත ආර්ථික සංවර්ධන සහ කර්මාන්ත අමාත්‍ය සිදොරින් සර්ජි, කමෙෂ්කෝවෝ දිස්ත්‍රික් ප්‍රධාන පරිපාලක කර්ගන්ස්කි අරියාටෝලි යන මහත්වරු ප්‍රමුඛ දූත පිරිසක් මේ මස 17 වැනිදා පාර්ලිමේන්තුවේදී නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ මහතා හමුවිය. මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මධුර විතානගේ මහතා ද එක්ව සිටියේය.

දැනට මෙරටට පැමිණෙන රුසියානු සංචාරකයන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමට මෙන්ම මෙරට ආයෝජන අවස්ථා වැඩිකිරීම ඇතුළු ද්විපාර්ශ්වික සබඳතා වර්ධනය කිරීම පිළිබඳව මෙහිදී සාකච්ඡා විය. ශ්‍රී ලංකාවේ මිතුරෙකු ලෙස රුසියාව සිය සහය උපරිම වශයෙන් ලබා දීමට අපේක්ෂා කරන බව ව්ලැඩිමියර් ප්‍රාන්ත ආර්ථික අමාත්‍යවරයා මෙහිදී පැවසීය.

අනතුරුව දූත පිරිස පාර්ලිමේන්තු පරිශ්‍රයේ නැරඹුම් සංචාරයකද නිරත විය.

මෙරට රුසියානු තානාපති කාර්යාලයේ, සංස්කෘතික අංශයේ ප්‍රධාන විධායක නිලධාරී බුද්ධප්‍රිය රාමනායක මහතා ද මෙම අවස්ථාවට එක්විය.





# පුවත්

# ශ්‍රී ලංකා - ඇමෙරිකානු එක්සත් ජනපද පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපති ධුරයට ගරු චන්දිම වීරක්කොඩි මහතා පත්වෙයි

ශ්‍රී ලංකා - ඇමෙරිකානු එක්සත් ජනපද පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව සභාපති ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චන්දිම වීරක්කොඩි මහතා මේ මස 23 වැනිදා තේරී පත්විය.



ශ්‍රී ලංකා - ඇමෙරිකානු එක්සත් ජනපද පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නව වැනි පාර්ලිමේන්තුවට අදාළ නිලධාරී මඩුල්ල තෝරා පත්කර ගැනීමේ විශේෂ රැස්වීම කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 23 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්විණි. ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපතිවරිය වන ජූලි චන්ග් මහත්මිය මෙහිදී විශේෂ ආරාධිතයා වශයෙන් එක්වූ අතර, පාර්ලිමේන්තුවේ සභානායක අමාත්‍ය ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා සහ පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ද මෙම අවස්ථාවට සහභාගී විය.

මෙහිදී ශ්‍රී ලංකා - ඇමෙරිකානු එක්සත් ජනපද පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව ලේකම්වරයා වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා ද, උප සභාපතිවරුන් වශයෙන් රාජ්‍ය අමාත්‍ය ගරු අරවින්ද් කුමාර් මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය සහ ගරු වේලු කුමාර් මහතා ද තේරී පත්වූහ.





මීට අමතරව, මිත්‍රත්ව සංගමයේ භාණ්ඩාගාරික වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා සහ උප ලේකම් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චාල්ස් නිර්මලනාදන් මහතා ද මෙහිදී තෝරාපත්කර ගැණිනි.

රැස්වීම අමතමින් ගරු කථානායකවරයා පවසා සිටියේ ශ්‍රී ලංකාව සහ ඇමෙරිකානු එක්සත් ජනපද අතර දශක ගණනාවක සිට පැවතෙන ද්විපාර්ශවීය සබඳතා මෙම සංගමය හරහා තවදුරටත් ශක්තිමත් වනු ඇති බවයි. එසේම අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන එක්සත් ජනපදයේ නියෝජිතායතනය (USAID) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රබල සංවර්ධන හවුල්කරුවෙකු වී ඇති බව කෘතවේදීව සඳහන් කළ කථානායකවරයා ඒ හරහා ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ වගවීම සවිමත් කිරීමේ ව්‍යාපෘතිය (SDGAP) සාර්ථකව අවසන් කර ඇති බව පෙන්වා දුන්නේ ය. තවද, USAID ආයතනය මගින් ධාරිතා සංවර්ධනය, කාරක සභා සහ මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම් සඳහා දක්වන සහාය පිළිබඳව කථානායකවරයා මෙහි දී සඳහන් කළේය.

මෙහිදී අදහස් දක්වමින් ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපතිවරිය ජූලි චන්ග් මහත්මිය අභිනව නිලධාරී මඩුල්ලට සුබ පැතුම් එක්කරමින් ප්‍රකාශ කර සිටියේ මෙම මිත්‍රත්ව සංගමය පිහිටුවීම තුළින් දෙරට අතර පාර්ලිමේන්තු හුවමාරු සහ අන්තර් සහයෝගිතාව ශක්තිමත් වනු ඇති බවයි.



# කාරක සභා පුවත්



# පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ (කෝපා කමිටුවේ) නව සභාපතිවරයා ලෙස රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා වැඩි ඡන්දයෙන් තේරී පත්වෙයි.




පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ (කෝපා කමිටුවේ) නව සභාපතිවරයා ලෙස රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා වැඩි ඡන්දයෙන් තේරී පත්විය. ඒ මහතා තේරී පත්වූයේ නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමු රැස්වීම මේ මස 24 වැනිදා පැවති අවස්ථාවේදීය.

එහිදී රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ නම ගරු ප්‍රසන්න රණවීර මහතා විසින් යෝජනා කළ අතර (ආචාර්ය) ගරු සුරේන් රාඝවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

එසේම, කෝපා කමිටුවේ සභාපති ධූරය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතාගේ නම පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අශෝක් අබේසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මනෝ ගනේෂන් මහතා විසින් ස්ථිර කරන ලදී. එහිදී පැවති ඡන්ද විමසීමේදී ගරු ලසන්ත අලගියවන්න මහතාට පක්ෂව ඡන්ද 14 ක් ලැබුණු අතර ගරු කබීර් හෂීම් මහතාට පක්ෂව ඡන්ද 07 ක් ලැබිණි.







2004 සිට කාරක සභා ගණනාවක් නියෝජනය කිරීමෙන් විශාල අත්දැකීම් ප්‍රමාණයක් තමා ලබා ඇති බවත්, මෙම කාරක සභාව තුළදී පක්ෂ භේද නොසලකා ස්වාධීනව රට වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් ඉටුකිරීමට බලාපොරොත්තු වන බවත් ඒ සඳහා කමිටු සාමාජිකයන් සියළුදෙනාගේම සහය අපේක්ෂා කරන බවත් මෙහිදී අදහස් දක්වමින් නව සභාපතිවරයා සඳහන් කළේය.

එමෙන්ම, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තු ඉතිහාසයේ පැරණිතම කාරක සභාව ලෙස 2023 ඔක්තොබර් මාසය වන විට වසර 100ක් සපුරණ බව සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

රටේ මූල්‍ය පාලනය හිමි පාර්ලිමේන්තුව විසින් අයවැය සම්මත කිරීමෙන් අනතුරුව සිදුවන ක්‍රියාවලිය පිළිබඳ පාර්ලිමේන්තුව වෙනුවෙන් එහි අධීක්ෂණය සිදු කරනු ලබන්නේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් වන බැවින් පාර්ලිමේන්තු සභා ගර්භයට ඇති වගකීමට සමාන වගකීමක් මෙම කාරක සභාවටද පවතින බව අලගියවන්න මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

# පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප් කමිටුවේ) නව සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) රන්ජිත් බණ්ඩාර මහතා වැඩි ඡන්දයෙන් නැවත තේරී පත්වෙයි.

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප් කමිටුවේ) නව සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) රන්ජිත් බණ්ඩාර මහතා වැඩි ඡන්දයෙන් නැවත තේරී පත්විය. ඒ මහතා තේරී පත්වූයේ නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමු රැස්වීම මේ මස 23 වැනිදා පැවති අවස්ථාවේදීය.

එහිදි පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (මහාචාර්ය) රන්ජිත් බණ්ඩාර මහතාගේ නම රාජ්‍ය අමාත්‍ය ගරු ජගත් පුෂ්පකුමාර මහතා විසින් යෝජනා කළ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

එසේම කෝප් කමිටුවේ සභාපති ධූරය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී එරාන් වික්‍රමරත්න මහතාගේ නම පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් බණ්ඩාර මහතා විසින් යෝජනා කරන ලද අතර පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රවුෆ් හකීම් මහතා විසින් ස්ථිර කරන ලදී. එහිදී පැවති ඡන්ද විමසීමේදී ගරු (මහාචාර්ය) රන්ජිත් බණ්ඩාර මහතාට පක්ෂව ඡන්ද 17 ක් ලැබුණු අතර ගරු එරාන් වික්‍රමරත්න මහතාට පක්ෂව ඡන්ද 06 ක් හිමිවිය.

කමිටුව අමතමින් නව කෝප් සභාපතිවරයා කියා සිටියේ කමිටුවේ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා සියලු සාමාජිකයින්ගේ සහයෝගය අපේක්ෂා කරන බවයි. පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමට පෙර කාරක සභාවේ පැවති කටයුතු අඛණ්ඩව සිදු විය යුතු බවට කාරක සභාවේ සාමාජිකයින්ගේ එකඟතාව පළවූ බවත් කාරක සභා සභාපතිවරයා අවධාරණය කළේය. තවද, කෝප් නිර්දේශවලට නීත්‍යානුකූලබවක් ලබා දීම සම්බන්ධයෙන් කථානායකවරයා සහ නීතිපතිවරයා සමඟ සාකච්ඡාවක් සංවිධානය කරන ලෙසටද කාරක සභා සභාපතිවරයා උපදෙස් ලබා දුන්නේය.










# පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ආර්ථික ස්ථායීකරණ අනු කාරක සභාවේ දෙවැනි වාර්තාව පිළිබඳ තරුණ නියෝජිතයින් ඇතුළු පාර්ශ්ව කිහිපයක් දැනුවත් කෙරේ.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කාරක සභාවේ දෙවැනි වාර්තාව පිළිබඳව සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්, මාධ්‍යවේදීන්, තරුණ නියෝජිතයින් ඇතුළු පාර්ශ්ව කිහිපයක් දැනුවත් කිරීම පාර්ලිමේන්තුවේදී සිදු විය.





මෙම දැනුවත් කිරීම සිදු වූයේ ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කමිටුව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 09 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙහිදී කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා පැමිණ සිටි විවිධ පාර්ශ්ව සඳහා මෙම වාර්තාවේ ඇතුළත් කරුණු පිළිබඳ සඳහන් කිරීම සිදු විය. එසේම මෙම වාර්තාවේ ඇතුළත් කරුණු පිළිබඳව සහ වෙනත් යම් දෙයක් පිළිබඳ කමිටුව දැනුවත් කිරීමට අවශ්‍ය නම් එය පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවිය හරහා සිදු කරන ලෙසත් දැනුවත් කිරීම සිදු විය.





එසේම මෙම වාර්තාව සකස්කිරීම සඳහා ක්ෂේත්‍ර ගණනාවක් නියෝජනය කරන ප්‍රවීණයන්ගේ අදහස් ලබාගෙන ඇති බවත් හෙතෙම වැඩිදුරටත් මෙහිදී සඳහන් කළේය. එසේම පැමිණ සිටි පාර්ශ්වයන් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන අදහස් පිළිබඳ විමසාබැලීමද මෙහිදී සිදුවූ අතර ඒ අනුව අඩු ආදායම්ලාභීන් නගාසිටුවීම, සමෘද්ධි සහනාධාරය ක්‍රමවත්ව ලබාදීම, දුෂ්කර පාසැල්වල දරුවන්ට නොමිලේ ආහාර ලබාදීම, පාසැල් උපකරණ මිල ගණන් ඉහළ යෑම, දැව ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය කිරීම, ගුවන් ක්ෂේත්‍රය සහ ධීවර කර්මාන්තය ආදී අංශ ගණනාවක් පිළිබඳවද මෙහිදී සාකච්ඡා කිරීම සිදු විය.

තවද ආර්ථික ස්ථායීකරණ අනු කාරක සභාවේ දෙවැනි වාර්තාවට අදාළව මහජන අදහස් දැක්වීම පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියට පිවිස සිදු කරන ලෙසද මෙම කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා මහජනතාවට ආරාධනාකිරීමද සිදු විය.



# ග්‍රාමීය ණය සහ සමාජ ආරක්ෂණ දැල සම්බන්ධයෙන් ජාතික සභා අනු කාරක සභාවේ අවධානය

ග්‍රාමීය ණය සහ සමාජ ආරක්ෂණ දැල සම්බන්ධයෙන් ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කාරක සභාවේදී සාකච්ඡා විය.

මේ පිළිබඳ සාකච්ඡා වූයේ ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 23 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙම කාරක සභාව සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යන ආයතනය සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඇතුළු ආයතන ගණනාවක් නියෝජනය කරන නියෝජිතයින් සහභාගී විය.



මෙහිදී අඩු ආදායම්ලාභීන් සඳහා සහන සැලසීම වෙනුවෙන් ආරම්භ කළ සමෘද්ධි වැඩසටහන ඇතුළු වෙනත් වැඩසටහන් මගින් ප්‍රතිලාභීන්ට සහන බෙදාහැරීම පිළිබඳව මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා විය. මේ අනුව මෙම ප්‍රතිලාභ ක්‍රමවත්ව අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් බෙදාහැරීම සම්බන්ධයෙන් ක්‍රමවේද සකස්කිරීම පිළිබඳව පැමිණ සිටි පාර්ශ්ව අදහස් දැක්වීම සිදු විය.

එසේම සමෘද්ධි බැංකුව ඇතුළු ග්‍රාමීය බැංකු මගින් ණය සහන ලබාදීම පිළිබඳවද මෙහිදී අවධානය යොමු විය.





# දැරිය හැකි මිලකට විශ්වාසදායක දිවාසුරැකුම් ක්‍රමවේදයන් ළමයින් වෙනුවෙන් නොමැතිවීම නිසා කාන්තාවන් බහුතරයකට රැකියා කිරීමට නොහැකි තත්ත්වයක් උදාවෙලා - වෙරිටේ රිසර්ච් ආයතනය පාර්ලිමේන්තු කාරක සභාවට පවසයි

ශ්‍රී ලංකාව තුළ ළමයින් සදහා වන දිවාසුරැකුම් මධ්‍යස්ථාන නියාමනය සදහා නිසිපරිදි රෙගුලාසි නොමැති වීම විශාල ගැටලුවක් බව වෙරිටේ රිසර්ච් ආයතනය පාර්ලිමේන්තුවේදී පැවසිය. බොහෝ දිවාසුරැකුම් මධ්‍යස්ථානවල ඉහළ මිල ගණන් අයකිරීම, විශ්වසනීයත්වය නොමැතිවීම වැනි කාරණා නිසා මෙරට කාන්තාවන්ට රැකියාවකට යාම ගැටලුවක් වී ඇති බව ද මෙහිදී අනාවරණය විය.

ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ සභාපතීත්වයෙන් මේ මස 09 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදී මේ පිළිබදව අනාවරණය විය.

කාරක සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරමින් වෙරිටේ රිසර්ච් ආයතනය වැඩිදුරටත් ප්‍රකාශ කළේ පවතින ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් බොහෝ පිරිසකට රැකියාවන් සදහා යොමුවීමට සිදුව ඇති බවයි.

එසේම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ආයතනික ප්‍රතිපත්ති නොමැතිකම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සමාජයේ පවතින දැඩි සම්මතයන් සහ ස්වාමියාගේ සහය නොමැතිවීම වැනි හේතු නිසා කාන්තාවන්ට රැකියාවක නිරත වීමට බාධා පවතින බව ද මෙහිදී අනාවරණය විය.

කාරක සභාව අමතමින් ගරු වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පවසා සිටියේ දිවාසුරැකුම් මධ්‍යස්ථාන ඇතුළු ළමාරක්ෂක සේවා නියාමනය කිරීම සඳහා විධිවිධාන අත්‍යවශ්‍ය බවත්, ඒ පිළිබඳව කමිටුව විසින් සොයා බලන බවත්ය.

ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ වෙස්ට්මිනිස්ටර් පදනම (WFD) සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) විසින් කාරක සභාව හමුවේ ඉදිරිපත් කරන ලද සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සහ අසාධාරණ වෙනස්කම් වැළැක්වීමේ පනත් කෙටුම්පත ද මෙහිදී සාකච්ඡාවට ගන්නා ලදී.

ඉදිරිපත් කර ඇති යෝජනා පුළුල් බැවින්, යෝජිත පනත් කෙටුම්පත සලකා බැලීම සදහා අධිකරණ අමාත්‍යවරයා වෙත යොමු කිරීමටද මෙහිදී තීරණය විය.

තවද, කාන්තාවන් සදහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත සහ කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත යන යෝජිත පනත් කෙටුම්පත්වල ප්‍රගතිය පිළිබදව ද මෙහිදී අවධානය යොමු විය. ඒ අනුව එම පනත් කෙටුම්පත් කඩිනමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව එහි සිටි නිලධාරීන් ප්‍රකාශ කළහ.







# ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාවක් පිහිටුවීමට පියවර

■ කෙටි, මධ්‍යම හා දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනු කමිටුවේදී සාකච්ඡා කෙරේ

■ ව්‍යවස්ථාපිතව සංස්ථාපනය වන යාන්ත්‍රණයක් ලෙස ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාව පිහිටුවීමට යෝජනා

වර්ෂ 2048 වන විට ශ්‍රී ලංකාව තිරසර සංවර්ධිත රටක් බවට පරිවර්තනය කිරීම උදෙසා සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම, නියාමනය හා පසුවිපරම් උපායමාර්ගික ක්‍රියාවලින් දියත් කිරීමේ අරමුණින් පිහිටුවීමට යෝජිත ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාවට අදාළ සංකල්ප පත්‍රිකාව පිළිබඳ සාකච්ඡාවක් මේ මස 07 වැනිදා පැවැත්විණි.

මේ පිළිබඳ සාකච්ඡා වූයේ කෙටි, මධ්‍යම හා දිගු කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනු කමිටුව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.




උක්ත ජාතික සභා අනු කමිටුවේ යෝජනා ස්ථිරත්වයෙන් ජනාධිපති ලේකම් සමන් ඒකනායක මහතාගේ සභාපතිත්වයෙන්යුත් ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාව පිහිටුවීමේ ක්‍රියාකාරී කමිටුව පිහිටුවා තිබේ. ජනාධිපති ලේකම් සමන් ඒකනායක මහතා සහ අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා විසින් උක්ත කොමිෂන් සභාවට අදාළ සංකල්ප පත්‍රිකාව අනු කමිටුව වෙත ඉදිරිපත් කරන




එම සංකල්ප පත්‍රිකාවට අනුව රටේ රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම පිණිස ස්ථාපිත ඉහළම මට්ටමේ නිල යාන්ත්‍රණය ලෙස ව්‍යවස්ථා සංශෝධනයක් තුළින් පිහිටුවීමට යෝජිතය. කොමිෂන් සභාවේ කාර්යයන් ලෙස නිසි විශ්ලේෂණ ආශ්‍රිතව ප්‍රතිපත්තිසම්පාදනය හා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ලබා දීම, කෙටි කාලීන මධ්‍යම කාලීන හා දීර්ඝ කාලීන සංවර්ධන සැලසුම්කරණය හරහා 2023 - 2048 ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම, රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ඇති හැකියාවන් හා විභවයන් හඳුනාගනිමින් සංවර්ධන සැලසුම්කරණය හා කාර්යක්ෂම අයුරින් සම්පත් බෙදී යාමට ඉඩ සැලසීම, කාලීන ජාතික ප්‍රමුඛතා පදනම්කොටගත් සංවර්ධන ක්ෂේත්‍ර හඳුනාගනිමින් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම, සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට සමගාමීව නිරන්තර නියාමන හා ඇගයීම් ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම, ජාතික හා පළාත් මට්ටම්වලදී ක්‍රියාත්මක කරනු ලබන ආයතන පද්ධති අතර අන්තර් සම්බන්ධීකරණ ක්‍රියාවලීන් ශක්තිමත්ව ක්‍රියාත්මක කරවීම යන කරුණු දක්වා ඇති අතර ඒ පිළිබඳ දීර්ඝ වශයෙන් කමිටුවේදී සාකච්ඡා කෙරිණි.

ඒ අනුව, කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම පිණිස කොමිෂන් සභා කාර්යාංශයක් පිහිටුවීමට යෝජිත අතර, එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙහෙයුම් කමිටුවක්ද ස්ථාපනය කිරීමට නියමිතය. එයට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 04, 27 සහ 148 වන ව්‍යවස්ථා යටතේ පාර්ලිමේන්තුවට එහි බලතල ක්‍රියාත්මක කිරීමට හැකි වන අයුරින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට අවශ්‍ය තාක්ෂණික මගපෙන්වීම් සහ පහසුකම් සැලසීම සඳහා ව්‍යවස්ථාපිතව සංස්ථාපනය වන යාන්ත්‍රණයක් ලෙස ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාව කටයුතු කිරීමට නියමිතය.



එමෙන්ම, කොමිෂන් සභාවේ දිගු කාලීන ප්‍රතිපත්ති සැලසුම් ලෙස 2023 - 2048 දක්වා ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික යටිතල පහසුකම් සැපයීම දක්වා ඇති අතර මධ්‍යකාලීන ප්‍රතිපත්ති සැලසුම් ලෙස පසු අවුරුදු මධ්‍යකාලීන සැලසුම්, රාජ්‍ය ආයෝජන සැලසුම් හා ආංශික සංවර්ධන සැලසුම් මෙන්ම කෙටි කාලීන ප්‍රතිපත්ති සැලසුම් යටතේ වාර්ෂික අයවැය සහ වාර්ෂික පළාත් අයවැය සැලසුම් කිරීම දක්වා තිබේ.

මෙහිදී අදහස් දැක්වූ කමිටු සභාපති නාමල් රාජපක්ෂ මහතා සඳහන් කළේ ඉතා ඉක්මනින් මෙම සංකල්ප පත්‍රිකාව ජාතික සභාවට ඉදිරිපත් කර අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා පියවර ගැනීමට බලාපොරොත්තු වන බවයි.







# පාර්ලිමේන්තු ඡායා ගැලරිය










**පාර්ලිමේන්තු ක්‍රීඩා සමාජය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අන්තර් දෙපාර්තමේන්තු සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය මෙවර බත්තරමුල්ල ජී.එච්.බුද්ධදාස ක්‍රීඩාංගනයේදී පැවැත්විණි.**



# පාර්ලිමේන්තුව සැකෙවින්...

## පෙබරවාරි 2023

මෙවර සටහන - එච්. ඊ. ජනකාන්ත සිල්වා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

**පෙබරවාරි**

### 8 බදාදා

- නව වැනි පාර්ලිමේන්තුවේ 4 වැනි සභාවාරය උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.
- ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් පාර්ලිමේන්තුව ඇමතීම.

### 9 බ්‍රහස්පතින්දා

- පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබුර් රහුමාන් මහතා මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා තේරී පත් වූ ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා විසින් නීති ප්‍රකාරව ප්‍රතිඥාව දෙනු ලැබීම.
- නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් නිවේදනය කරනු ලැබීම.
- නව වැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා තේරීම් කාරක සභාව පත් කරනු ලැබීම
නව වැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය විවෘත කරමින් ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව කල් තැබීමේ විවාදය ආරම්භ කිරීම.

### 10 සිකුරාදා

- නව වැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය සඳහා සභාපති නාමාවලිය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 143 ප්‍රකාරව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් නිවේදනය කරනු ලැබීම.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, ගෘහ්‍ය කාරක සභාව, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව, ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව, ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යන කාරක සභාවන් සඳහා සාමාජික මන්ත්‍රීවරයන් සංඛ්‍යාව වැඩි කිරීම.

## 21 අඟහරුවාදා

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ආංශික අධීක්ෂණ කාරක සභාව, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, ගෘහ්‍ය කාරක සභාව, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව, ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව, ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යන කාරක සභා සඳහා සාමාජික මන්ත්‍රීවරයන් පත් කරනු ලැබීම.

## 22 බදාදා

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, ගෘහ්‍ය කාරක සභාව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභා සඳහා ඉතිරි සාමාජික මන්ත්‍රීවරයන් පත් කිරීම.

## 23 බ්‍රහස්පතින්දා

ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත සහ රතනතිස්ස සාමපදනම සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත දෙවනවර කියවා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරනු ලැබීම.

## 24 සිකුරාදා

අභාවප්‍රාප්ත ගරු රොහාන් අබේගුණසේකර, ගරු අබ්දුල් බායිස් කමර්ඩීන්, ගරු අතාවුද සෙනෙවිරත්න සහ ගරු තිස්ස ආර්. බළල්ල යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ශෝක යෝජනා ඉදිරිපත් කරනු ලැබීම.

# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන I 32 වැනි කාණ්ඩය I පෙබරවාරි 2023
ISSN 2806 – 5425

සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka